GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/08/12

**මාධ්‍ය නිවේදනයයි**

**වෘත්තිය සමිතියක සාමාජීය මෙහෙවර තුලින් රෝගී ජනතාවට යහපත් හෙට දිනක් බිහි කිරීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ කටයුතු නැවත ආරම්භ කිරීම**

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය අකර්මන්‍ය කිරීමට දරණ ලද උත්සාහයන් වසර 2012 සිට පවත්වන ලද සෑම වාර්ෂික නිලවරණයකටම ආසන්නයේදි දක්නට ලැබුණි.

උදා:-

- 2012 දි රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ නිළවරණය පිළිබඳව කොළඹ දිසා අධිකරණයේ වාරණ නියෝගයක් ඉල්ලා පවරන ලද අංක 169/12DSP දරන නඩුව එකී දිසා අධිකරණයේ දිසා විනිසුරුතුමා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිණි.
- 2013 දි රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ නිලවරණය පිළිබඳව කොළඹ අංක 01 අධිකරණයේ වාරණ නියෝගයක් ඉල්ලා අංක 114-13-DSP දරන නඩුව පවරණ ලද අවස්ථාවේදි එකී දිසා අධිකරණයේ අතිරේක දිසා විනිසුරුතුමා විසින් වාරණ නියෝගයක් නිකුත් නොකරන ලදි.
- 2014 දි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිලවරණය පිළිබඳව ගල්කිස්ස දිසා අධිකරණයේ වාරණ හා අතුරු තහනම් නියෝගයක් ඉල්ලා ඉදිරිපත් කර අංක 1337/14/SPL නඩු විභාගය එම අධිකරණයේ ගරු විනිශ්චයකාරතුමා විසින් අත්හිටුවන ලද අතර එය විසුරුවා හැරීමට ක්‍රියා කරන ලදි.

සංගමයේ කටයුතු වාරණය කරන ලද කාලය තුළදි භාරකාරත්ව මණ්ඩලය විසින් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය සම්බන්දව ප්‍රවෘත්ති පළ කිරීමෙන් වලකින ලෙස සියලු සාමාජිකත්වය වෙත දන්වා තිබියදි ඊට පටහැනිව ප්‍රවෘත්ති සාකච්ජා පවත්වමින් අසත්‍ය ප්‍රකාශ හා තොරතුරු නිකුත් කර සංගමය කඩාකප්පල් කිරීමට සහ අන්තර් පාලනයකට පාර කැපීම සඳහා උත්සාහ කරනු දක්නට ලැබිණි. සුළු පිරිසකගේ මෙම කටයුතු තුලින් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ ව්‍යවස්ථාව දැඩි ලෙස උල්ලංඝණය වු අතර සංගමයේ පැවැත්මට හානිකර තත්ත්වයක් ඇති විය. එමෙන්ම මෙම සුළු පිරිස මධ්‍යම කාරක සභා තීරණ වලට එරෙහිව කටයුතු කල අතර රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ සාමාජිකත්වය දරණ ශ්‍රේණි වෛද්‍ය, පරිපාලන වෛද්‍ය සහ විශේෂඥ වෛද්‍ය යන කණ්ඩායම් අතර අසමගිය ඇති කිරීමට කටයුතු කලහ.

**මේ වන විට වාරණය ඉවත් කිරීම හරහා රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ පූර්ණ ක්‍රියාකාරීත්වය නැවත ආරම්භ වී ඇති අතර ඉදිරියේදි පහත දැක්වෙන තේමා යටතේ සාමාජිකත්වයට සහ රටේ සාමාන්‍ය ජනතාවට එහි ප්‍රතිලාභ අත්වනු ඇත.**

1. මූලික වැටුප් සංශෝධනය සහ රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකටම පොදු වැටුප් ව්‍යුහයක් ඇති කිරීමට කටයුතු කිරීම.

2. නිවැරදි ආයතන ව්‍යුහයක් ඇති කිරීම තුලින් සේවක කණ්ඩායම් අතර ගැටලු අවම කිරීමට කටයුතු කිරීම සහ රෝගියාට ලබා දෙන සේවය විධිමත් කිරීම.
3. සේවා ව්‍යවස්ථා සංශෝධනයන් මගින් ශ්‍රේණි, පරිපාලන හා විශේෂඥ වෛද්‍ය යන කණ්ඩායම් 03 ටම වඩා යහපත් සේවා තත්ත්වයන් ඇති කිරීම.
4. ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය, ජාතික ඖෂධ ප්‍රතිපත්තිය, රජරට ව්‍යාප්තව ඇති වකුගඩු රෝග තත්ත්වය වැනි ජනතාවට සෘජුවම අදාල ප්‍රශ්ණ වලදී ප්‍රතිපත්ති සම්පාදන කටයුතු වලට දායක වීම.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය අකර්මණ්‍ය වී ඇති අවස්ථාවේදී සත්‍ය තොරතුරු ජනතාව වෙත රැගෙන ගිය ජනතාවාදී මාධ්‍ය වෙත අපගේ ස්තුතිය පල කරන අතර, එම මාධ්‍ය ඉහත කරුණු ද ජනතාව වෙත රැගෙන යාමට ඉදිරියේදී සහය වනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

ස්තුතියි,

වෛද්‍ය ලසන්ත ජිනදාස
ලේකම්

**වැඩිදුර විස්තර සඳහා :** වෛද්‍ය සමන්ත ආනන්ද - 0777666301
වෛද්‍ය නවීන් සොයිසා - 0718582444